# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

# 1981 අංක 60 දරන ගෝඝාතක (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 සැප්තැම්බර් මස 16 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරනු ලදී.

1981 සැප්තැම්බර් මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 20 යි | තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1981 අංක 60 දරන ගෝඝාතක (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 සැප්තැම්බර් මස 16 වන දින]

එල්. ඩී.—ඕ. 108/78

ගෝඝාතක ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1981 අංක 60 දරන ගෝඝාතක (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගෝඝාතක ආඥාපනතේ 20 වන වගන්තියෙහි "රුපියල් පනහකට වැඩි නොවන දඩයකට හෝ එම දඩය ගෙවීම පැහැර හරිනු ලැබූ විට, ලිත් මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා බරපතල වැඩ ඇතිව හෝ නැතිව බන්ධනාගාරගත කිරීමකට හෝ ඔහු යටත් විය යුතුය" යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 52 වන අධිකාරයේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

"රුපියල් දෙසියයකට වැඩි නොවන දඩයකට හෝ හය මාසයකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි "රුපියල් එක් සියයකට වැඩි නොවන දඩයකට හෝ හය මාසයකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ යටත් විය යුතුය" යන වචන වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින්, සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

"රුපියල් තුන් සියයකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු දෙකකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.".

ර 57760—13,900 (81/07)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 60 කි. (විදේශීය) රු. 80 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.